(143)


# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/6/5/1/SBLEG – NS I (2022)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2022.10.14

චක්‍රලේඛ අංක : **34/2022**

සියලු ම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත,

පාසලේ නම: ..............................................................................

..............................................................................

**අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම: සාමාන්‍ය අධ්‍යාපනය (2018-2024)**
**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM Project)**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

**විෂයය: ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මකවන සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ සංරචකයන් පාසල තුළ ඵලදායී ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා සියලු ම ජාතික පාසල් සඳහා ලබා දෙන "පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානය" (School-Based Learning Enhancement Grant - SBLEG) (2022)**

**1.0** සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සංවර්ධනය සඳහා ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය 2018-2024 කාලසීමාවේ දී අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක කෙරේ. ලෝක බැංකු ව්‍යාපෘතියේ ශ්‍රී ලංකා රජයට ප්‍රතිපාදන ලැබීම, එකඟ වී ඇති ව්‍යාපෘතියේ ප්‍රතිඵල/දර්ශක අත්පත් කර ගැනීම හා බැඳී පවතින බැවින් මෙම ව්‍යාපෘතිය පාසල් පද්ධතිය තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුළින් පමණක් මෙම දර්ශක කරා ළඟාවිය හැකිවන අතර, එමඟින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට මූල්‍යමය ආධාර හිමිවීම සිදුවේ.

මෙම ව්‍යාපෘතියේ සංරචකයන් වැඩි වශයෙන් ක්‍රියාත්මක කරනුයේ පාසල් තුළ වන අතර, එම සංරචකයන් පාසල්වල සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පාසල්වලට මූල්‍ය ප්‍රදානයක් ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත. එසේ ම, මෙම මූල්‍ය ප්‍රතිපාදනවලින් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිවේ. ඒ අනුව සියලු ම ජාතික පාසල් සඳහා අවසන් ගෙවීමක් ලෙස (Outright Grant) මෙම පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානය ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු යොදා ඇත. එම ප්‍රදානය ක්‍රමවත්ව උපයෝජනය කිරීම සම්බන්ධ උපදෙස් මෙම චක්‍රලේඛය මඟින් නිකුත් කෙරේ.

**සටහන:** පළාත් පාසල් සඳහා මෙම ප්‍රදානය පළාත් ප්‍රතිපාදන හරහා ලබාදීමට කටයුතු කෙරේ.

**2.0** මෙම ව්‍යාපෘතියේ සංරචකයන් වැඩි වශයෙන් පාසල් නඟාසිටුවීමේ වැඩසටහන යටතේ පාසල් පාදකව ක්‍රියාත්මක කළ යුතු අතර, එම වැඩසටහන් වඩාත් ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා, එනම් පාසල් සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් ඉහළ නැංවීමට අදාළ විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන්, ගුරුවරුන්ගේ වෘත්තීය ධාරිතා සංවර්ධන වැඩසටහන්, විෂයානුබද්ධ වැඩසටහන්, විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා මෙම ප්‍රදානය යොදා ගත හැකිය. සමස්තයක් වශයෙන් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම උදෙසා ශිෂ්‍ය ඉගෙනුම් සාධන මට්ටම් හා සිසුන් තුළ උසස් මට්ටමේ ඉගෙනුම් නිපුණතා (higher-order learning competencies) ප්‍රවර්ධනය කිරීමට මෙම ප්‍රදානය යොදා ගැනීමට කටයුතු කළ යුතුය


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

142

**3.0** මෙම ප්‍රදානයේ ප්‍රථම පියවර ලෙස ඔබ පාසලට රුපියල් .....................ක ප්‍රදානයක් අවසන් ගෙවීමක් ලෙස (Outright Grant) ලබාදෙන අතර එය ඔබ පාසලේ "පාසල් සංවර්ධන බැංකු ගිණුමට" අධ්‍යාපන අමාත්‍යාංශයේ ගිණුම් අංශය විසින් බැර කරනු ඇත. මෙම ප්‍රදානය ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන "සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (General Education Modernization Project)" මූල්‍ය ප්‍රතිපාදන හරහා ලබා දෙනු ලැබේ. මෙම ප්‍රදානය හරහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්/ ව්‍යාපෘති සම්බන්ධයෙන් ඔබ පාසල දක්වන කාර්යක්ෂමතාව හා කාර්යසාධනය සලකා බලා කාර්යසාධනය මත පදනම් වූ (performance-based) ක්‍රමවේදයකට අනුව මෙහි දෙවන පියවර යටතේ ප්‍රදානය ලබාදීමට කටයුතු කරනු ලැබේ.

**4.0 මූල්‍ය ප්‍රදානය උපයෝජනය කළ යුතු ක්ෂේත්‍රයන් හා ප්‍රතිපාදන වෙන් කිරීමේ ප්‍රමුඛතාව**

ප්‍රතිපාදන වෙන්කිරීමේ දී සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ පහත සඳහන් සංරචකයන් 10 ඔස්සේ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදිය යුතු වේ.

- ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ වැඩසටහන්.
- ගණිත/විද්‍යා විෂය ඉගෙනුම් ප්‍රවර්ධන වැඩසටහන්.
- සිසුන්ගේ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්.
- පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන්.
- පාසල් කළමනාකරණ හා ප්‍රමිති වැඩසටහන්.
- පාසල් නහාසිටුවීමේ වැඩසටහන් (දරුවන්ගේ සමාජ කුසලතා සංවර්ධනය සඳහා වූ වැඩසටහන් සඳහා ප්‍රමුඛතාව ලබාදිය යුතු ය.)
- සමාජ ඒකාග්‍රතාව, සාමය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්.
- අන්තර්කරණ අධ්‍යාපන සංවර්ධනය කිරීමේ වැඩසටහන්.
- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්.
- පාසල් ලිබඩු උපකරණ මිලදී ගැනීම, නඩත්තුව හා අලුත්වැඩියාව.

මෙම සංරචකයන් ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදෙන **ප්‍රදානයෙන්** පාසල් ලිබඩු උපකරණ මිලදී ගැනීම, නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු **50% ක උපරිමයකට යටත්ව** සිදු කළ යුතුය. මෙම සංරචකයන් පිළිබඳ විස්තරාත්මක සටහනක් **ඇමුණුම් 01 [SBLEG-NSI (2022)]** හි දක්වා ඇත.

මෙම ප්‍රදානය හරහා ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති/ වැඩසටහන් පාසල් සංවර්ධන කමිටුව හා පාසල් කළමනාකරණ කමිටුව විසින් සාකච්ඡා කර ප්‍රමුඛතා පදනමින් හඳුනාගත යුතු ය. ඒ අනුව ඔබ පාසලට **මුදල් බැරවීමෙන් අනතුරුව,** මෙම ප්‍රදානය හරහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති/ වැඩසටහන්/ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් 2022 **පාසල් වාර්ෂික සංවර්ධන සැලැස්මෙහි සංරචකයන් ලෙස උප සැලැස්මක් ඇමුණුම 02 [SBLEG-NSI (2022)]** හි ආකෘතියට අනුව **පිළියෙළ කර එක් මසක් ඇතුළත දී කලාප අධ්‍යක්ෂකගේ නිර්දේශය සහිතව අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) වෙත නොපමාව යොමු කළයුතු වේ.**

**සටහන:** උක්ත වැඩසටහන් මේ වනවිට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ සහ උපදෙස් පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ.

**5.0** මුදල් භාර ගැනීම

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙන පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානය අදාළ පාසලේ පාසල් සංවර්ධන බැංකු ගිණුමට බැර කරනු ලැබේ. මෙම ප්‍රදානය ලද වහාම අදාළ පාසලේ විදුහල්පති විසින් ඒ සම්බන්ධයෙන් 2018.06.22 දාතම අංක 2018/26 චක්‍රලේඛයෙන් උපදෙස් ලබා දී ඇති පරිදි ආකෘතියක් භාවිතා කොට එම ප්‍රදානය ලද බව සඳහන් කරන ලද ආවරණ ලිපියක් සමඟ "ගණකාධිකාරී/ගෙවීම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" වෙත අනිවාර්යෙන්ම එවිය යුතුය. එමෙන්ම, එම ආවරණ ලිපියේ හා ලදුපතෙහි විදුහල්පති විසින් සහතික කරන ලද ඡායා පිටපතක් "අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික පාසල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ද ලැබීමට සැලැස්විය යුතුය.

**6.0** මෙම ප්‍රදානය මඟින් ලැබෙන මුදල් ගිණුම්ගත කළ යුත්තේ පාසල් සංවර්ධන ගිණුම යටතේ ය. තව ද, එම විශේෂ ප්‍රදානය සම්බන්ධයෙන් වැය ලෙජර වෙනම පිටුවක නඩත්තු කළ යුතු අතර අදාළ ගිණුම් වාර්තා වෙනම පවත්වා ගත යුතුය. **මෙම ප්‍රදානය යටතේ ලැබෙන සියලුම මුදල් 2023 පෙබරවාරි 28 දින වනවිට සම්පූර්ණයෙන් ම වැය කර අවසන් කළ යුතුය.**

**7.0** 2018.06.22 දාතම අංක 2018/26 චක්‍රලේඛය හා මාර්ගෝපදේශ අත්පොත හි ඇතුළත් විධිවිධාන අනුව සිව්මස් ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ දී මෙම වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2023 මාර්තු 31 දිනට ප්‍රථමව ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා **ඇමුණුම 03 [SBLEG-NSI (2022)]** ආකෘතිය භාවිතා කළ යුතුය. භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා "අධ්‍යාපන අධ්‍යක්ෂ/ ජාතික පාසල්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට අදාළ දිනයට පෙර ඉදිරිපත් කළ යුතුය.

**8.0 නියාමනය, වාර්තාකරණය හා විගණනය**

මෙම ප්‍රදානය යොදා ගනිමින් කෙටිකාලීන එහෙත් ඵලදායී ව්‍යාපෘති/වැඩසටහන්/ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම තුළින් පාසල්වල සිසුන්ගේ ඉගෙනුම් සාධන මට්ටම් ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. මෙම ප්‍රදානය ඵලදායීව උපයෝජනය කරනු ලබන්නේ ද යන්න පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සෘජුවම නියාමනය කරනු ලබන අතර, අධ්‍යාපන අධ්‍යක්ෂ (ගණිත, ඉංග්‍රීසි, පාසල් පුස්තකාල, පාසල් සෞඛ්‍ය හා පෝෂණ, කළමණාකරණ හා ප්‍රමිති, ගුරු අධ්‍යාපන පරිපාලන) විසින් ද තම විෂයට අනුව නියාමනය කරනු ලැබේ. ඊට අමතරව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්) හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් වගබලා ගතයුතු අතර ඒ සම්බන්ධයෙන් නිරන්තරයෙන් වාර්තා තබා ගැනීම හා අධීක්ෂණය කිරීමට මෙයින් බලය පවරමි. එසේම මෙම ප්‍රදානය උපයෝජනය කිරීම පිළිබඳ විගණනයට යටත් වේ.

**9.0** මෙම චක්‍රලේඛය හා මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීමට අදාළව පැන නගින ඕනෑම ගැටළුවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අර්ථ නිරූපනය හා අවසාන තීරණය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

**එම්.එන්.රණසිංහ**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටපත්:**

1. විගණකාධිපති
2. සියලු ම අතිරේක ලේකම්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
3. සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
4. සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
5. සියලු ම පළාත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්(සැලසුම්)
6. සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
7. අධ්‍යක්ෂ ජනරාල්/ මූල්‍ය කළමනාකරණ, අධ්‍යාපන අමාත්‍යාංශය
8. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
9. ප්‍රධාන ගණකාධිකාරී/ මූල්‍ය කළමනාකරණ, අධ්‍යාපන අමාත්‍යාංශය
10. ප්‍රධාන ගණකාධිකාරී/ ව්‍යාපෘති කළමනාකරණ, අධ්‍යාපන අමාත්‍යාංශය
11. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යාපන අමාත්‍යාංශය
12. ප්‍රධාන කොමසාරිස්/ අධ්‍යාපන විද්‍යාපීඨ, අධ්‍යාපන අමාත්‍යාංශය
13. ගණකාධිකාරී/ විවිධ ගිණුම්, අධ්‍යාපන අමාත්‍යාංශය
14. ගණකාධිකාරී/ ගෙවීම්, අධ්‍යාපන අමාත්‍යාංශය
15. සියලු ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

| ප්‍රතිපාදන වෙන් කළයුතු ප්‍රමුඛ ක්ෂේත්‍රයන් | මූල්‍ය ප්‍රදානය උපයෝජනය කළ යුතු ක්ෂේත්‍රයන් |
|---|---|
| 1.0 ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් | **පුනරාවර්තන:**<br>1.1 ශිෂ්‍ය ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් හා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය ඉහළ නැංවීම හා සිසුන් තුළ උසස් මට්ටමේ කුසලතා වැඩිදියුණු කිරීමට අදාළ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ විශේෂ ව්‍යාපෘති/ වැඩසටහන්/ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.<br>1.2 ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් හා පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>1.3 විෂයානුබද්ධ, විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.<br>1.4 ශිෂ්‍ය නිර්මාණශීලී හා නවෝත්පාදක වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>1.5 ඉංග්‍රීසි විෂයයට අදාළව පාසල් මට්ටමේ විෂය ඇගයීම් හා සම්බන්ධ කටයුතු.<br>**ප්‍රාග්ධන:**<br>1.6 පුස්තකාල පොත් අල්මාරි/ කබඩ් මිලදී ගැනීම |
| 2.0 ගණිත විෂය ඉගෙනුම් ප්‍රවර්ධන වැඩසටහන් | **පුනරාවර්තන:**<br>2.1 ශිෂ්‍ය ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් හා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය ඉහළ නැංවීම හා සිසුන් තුළ උසස් මට්ටමේ කුසලතා වැඩිදියුණු කිරීමට අදාළ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ විශේෂ ව්‍යාපෘති/ වැඩසටහන්/ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.<br>2.2 ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් හා පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>2.3 විෂයානුබද්ධ, විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.<br>2.4 ශිෂ්‍ය නිර්මාණශීලී හා නවෝත්පාදක වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>2.5 අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය විසින් නිර්දේශිත ඉගෙනුම් සම්පත් ද්‍රව්‍ය "දැලිස", "ක්‍රියාකාරකම් පාදක ගණිත අත්වැල", "අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප මත ප්‍රතිකාර්ය අධ්‍යාපනය", "ගණිත පහසුවෙන්"<br>**ප්‍රාග්ධන:**<br>2.6 ගණිත ඉගෙනුම් කට්ටල (ප්‍රාථමික හා ද්විතියික) |
| 3.0 වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් | 3.1 පාසල් ශිෂ්‍ය වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| 4.0 පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන්. | **පුනරාවර්තන:**<br>4.1 ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් හා පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>4.2 ගුරු ආකල්ප චර්යාවන් හා ගුරු භූමිකාව පිළිබඳ ගුරු සංවර්ධන වැඩසටහන් පාසල තුළ සංවිධානය කිරීම.<br>4.3 අධ්‍යාපනයේ ඇතිවන නව ප්‍රවණතා ඉගෙනුම් ක්‍රියාකාරකම් හා සම්බන්ධ තාක්ෂණික නිපුණතා පිළිබඳ අවබෝධය ගුරුවරුන්ට ලබාදීමේ වැඩසටහන |
| 5.0 පාසල් කළමනාකරණ හා ප්‍රමිති වැඩසටහන්. | 5.1 පාසල් මට්ටමේ ශිෂ්‍ය ප්‍රාප්ති මට්ටමෙහි ගුණාත්මක ප්‍රමිතීන් තහවුරු කිරීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| 6.0 පාසල් නහාසිටුවීමේ වැඩසටහන්. | **පුනරාවර්තන:**<br>6.1 පාසල් මට්ටමේ පාසල් නහා සිටුවීමේ වැඩසටහන හා සම්බන්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම<br>6.2 ශිෂ්‍ය සාමාජීය කුසලතා ඉහළ නැංවීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>6.3 ප්‍රජා සහභාගිත්වය සහිතව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධනයන වැඩසටහන |
| 7.0 සමාජ ඒකාග්‍රතාව, සාමය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්. | 7.1 සාමාජ ඒකාග්‍රතාව සාමය හා සංහිඳියාව ප්‍රවර්ධනය උදෙසා පාසල් මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| 8.0 අන්තර්කරණ අධ්‍යානය සංවර්ධනය කිරීමේ වැඩසටහන්. | 8.1 ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් හා පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>8.2 පාසල් මට්ටමින් අන්තර්කරණ අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| 9.0 පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන | 9.1 ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් හා පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>9.2 පාසල් මට්ටමේ පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. |
| 10.0 පාසල් ලීබඩු හා අනෙකුත් උපකරණ මිලදී ගැනීම, නඩත්තුව හා අලුත්වැඩියා කිරීම. | **ප්‍රාග්ධන:**<br>10.0 ශිෂ්‍යයින් සඳහා පන්ති කාමර ලීබඩු (මේස,පුටු, අල්මාරි, කබඩ්) හා අනෙකුත් උපකරණ මිලදී ගැනීම.<br>10.1 ගුරුවරුන් සඳහා පන්ති කාමර ලීබඩු (ගුරු මේස, ගුරු පුටු, අල්මාරි, කබඩ්) හා අනෙකුත් උපකරණ මිලදී ගැනීම<br>10.2 ශිෂ්‍යයින් සඳහා පන්ති කාමර ලීබඩු (මේස,පුටු, අල්මාරි, කබඩ්) හා අනෙකුත් උපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව.<br>10.3 ගුරුවරුන් සඳහා පන්ති කාමර ලීබඩු (ගුරු මේස, ගුරු පුටු, අල්මාරි, කබඩ්) හා අනෙකුත් උපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව. |

ඇමුණුම 02 [SBLEG-NSI (2022)]

අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම: සාමාන්‍ය අධ්‍යාපනය (2018-2024)
සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM Project)
අධ්‍යාපන අමාත්‍යාංශය

## "පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානය" (School-Based Learning Enhancement Grant-SBLEG) (2022)

| අනු අංකය | ව්‍යාපෘතිය / වැඩසටහන | අරමුණු |
|---|---|---|
| 1 | -------------------------------- | 1.1 --------------------------------<br>1.2 --------------------------------<br>1.3 -------------------------------- |
| 2 | -------------------------------- | 2.1 --------------------------------<br>2.2 --------------------------------<br>2.3 -------------------------------- |

| අනු අංකය | ව්‍යාපෘතිය /වැඩසටහන | කාල රාමුව | ඇස්තමේන්තු මුදල රුපියල් | අපේක්ෂිත නිමවුම් (Output) | අපේක්ෂිත ප්‍රතිඵල (Outcome) | ක්‍රියාත්මක කිරීමේ වගකීම | වෙනත් සටහන් |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

අත්සන : ..................................................

විදුහල්පතිගේ නම : ..................................................

දිනය : ..................................................

ඉහත සඳහන් ව්‍යාපෘති වාර්තාව නිර්දේශ කරමි.

අත්සන : ..................................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ : ..................................................

(නිල මුද්‍රාව)

දිනය : ..................................................

**පිටපත් :** පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය

ඇමුණුම 03 [SBLEG-NSI (2022)]

අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම: සාමාන්‍ය අධ්‍යාපනය (2018-2024)
සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM Project)
අධ්‍යාපන අමාත්‍යාංශය

## "පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදානය" (School-Based Learning Enhancement Grant-SBLEG) (2022)

පාසල් මට්ටමින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම

පාසලේ නම : ......................................................

| පා .ප්‍ර.ප්‍ර.ඉ.පා. යටතේ ලද මුදල රුපියල් | ප්‍රදානය ලද දිනය | ඉටු කරන ලද ව්‍යාපෘතිය /ව්‍යාපෘති / වැඩසටහන | වැය ඇස්තමේන්තුව රුපියල් | 2022 .......... දිනට භෞතික ප්‍රගතිය | 2022 ........... දිනට මූල්‍ය ප්‍රගතිය | වෙනත් සටහන් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට සහතික කරමි

අත්සන : ..................................................

විදුහල්පතිගේ නම : ..................................................

දිනය : ..................................................

ඉහත සඳහන් වැය විස්තරයට අදාළ කාර්යයන් භෞතිකව පරීක්ෂා කරන ලද අතර, එහි මූල්‍ය ප්‍රගතිය නිවැරදි බවට සඳහන් කරමි.

අත්සන : ..................................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ : ..................................................

නිල මුද්‍රාව

දිනය : ..................................................

පිටපත් : පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය

(138)